# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: TTIP/PIM/4/3/9 General
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2010.12.24

වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක: **01(1)/2010**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත

**සහනදායී පදනම මත වාහන ආනයනය කිරීම - පොදු උපදෙස්**

2010.12.10 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2010 යටතේ සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අයදුම්පත් නිර්දේශ කිරීමේ දී පහත සඳහන් උපදෙස් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. චක්‍රලේඛයේ 01 (අ), (ආ), (ඇ) හා (ඈ) යටතේ සුදුසුකම් ලැබීම සඳහා අදාළ නිලධාරීන්, "ජ්‍යෙෂ්ඨ මට්ටමේ" විධායක තනතුරක වසර හය (06)ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, (ඉ), (ඊ), (උ) හා (ඌ) යටතේ සුදුසුකම් ලැබීම සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ විධායක තනතුරක වසර දොළහ (12) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

03. චක්‍රලේඛයේ 02.01 (ආ) අනුව, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක (HS Heading) 87.03 යටතට, පුද්ගල ප්‍රවාහනය සඳහා සැලසුම්කරන ලද (Principally designed for the transport of persons), අළුත්ම (Brand New) හෝ පාවිච්චිය වසරකට නොවැඩි කාර්, ජීප්, ස්ටේෂන් වැගන් සහ කැබ් රථ විය යුතු ය.

04. පාවිච්චි කරන ලද වාහන ආනයනයේදී අදාළ වාහනයේ කාලය වශයෙන් සලකනු ලබන්නේ, අංක 1681/14 හා 2010.11.22 දිනැති ගැසට් පත්‍රයට අනුව, වාහනය ප්‍රථම වරට ලියාපදිංචි කිරීමේ දිනය (date of first registration) හා නැව් ගත කළ දිනය (නැව් භාර පත්‍රයේ දිනය/ date of Bill of Lading) අතර කාලයයි.

05. මෙම යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරන/ මිල දී ගන්නා මෝටර් රථ සඳහා, එකතුකල අගය මත බද්ද, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද ඇතුලත්ව බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතු පහත වගුවේ දැක්වෙන මුළු බදු ප්‍රමාණයට ගැලපෙන පරිදි නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු හා රේගුබදු ගැලපීම් කිරීමට ශ්‍රී ලංකා රේගුව කටයුතු කරනු ඇත.

| වාහන වර්ගය සහ උපරිම සිලින්ඩර ධාරිතාවය (පෙට්‍රල් / ඩීසල්) | රේගු වටිනාකම (CIF පදනම) මත ගෙවිය යුතු බදු ප්‍රතිශතය |
|---|---|
| 1000cc | 50 |
| 1600cc | 55 |
| 2000cc | 60 |
| 2600cc | 70 |

06. මෙම සහනදායී යෝජනාක්‍රමය යටතේ වාහන ඉල්ලුම් කරන නිලධාරීන් මෙම චක්‍රලේඛය සමඟ ඇති ආදර්ශ අයදුම්පත (Annexture 1) පරිදි ඉල්ලුම්පත්‍රයක් (ජායස්ථික පිටපතක්) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් (පරිගණකගත කිරීමේ පහසුව සඳහා) සම්පූර්ණ කර, එම අයදුම්පත් බහාලන ලද කවරයේ ඉහළ වම් කෙළවරේ **"සහනදායී පදනම මත වාහන බලපත්‍ර අයදුම් කිරීම"** යනුවෙන් සඳහන් කර, අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 3 වැනි මහල, මහා භාණ්ඩාගාරය, කොළඹ 01 යන ලිපිනය ලියූ ලියුම් කවරයක් ද සහිතව තම දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාට භාර දිය යුතුය.

07. මෙම සහනදායී යෝජනාක්‍රමය යටතේ වාහන ආනයනය කිරීමට හිමිකම් ලබන නිලධාරීන් කවුරුන්ද යන්න චක්‍රලේඛ උපදෙස් පරිදි දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා විසින් නිවැරදිව හඳුනාගෙන, ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රය නිසි පරිදි පරීක්ෂා කොට, අවශ්‍ය සුදුසුකම් සහ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව සටහන් කර ඇත්ද යන්න සනාථ කරගැනීමෙන් පසු, අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වෙත ඉදිරිපත් කළ යුතුය.

08. අමාත්‍යාංශය විසින් සහතික කළ ඉල්ලුම්පත්, තැපැලෙන් පමණක් අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 3 වැනි මහල, මහා භාණ්ඩාගාරය, කොළඹ 01 යන ලිපිනයට අදාළ අමාත්‍යාංශය විසින් එවීමට කටයුතු කළ යුතු අතර, අයදුම්කරුවන් පෞද්ගලිකව අතින් ගෙනගොස් භාරදීම සිදු නොකළ යුතුය.

09. අදාළ අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන අනුක්‍රමික අංක පිළිවෙලට බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි.

10. සහනදායී බලපත්‍ර මත ආනයනය කරන ලද මෝටර් රථ රේගුවෙන් නිශ්කාෂණය කර ගැනීමේදී බලපත්‍රලාභීන්ගේ පහසුව සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒ සඳහා වෙනම නිශ්කාෂණ කවුළුවක් විවෘත කර තබනු ලැබේ.

11. මෙම චක්‍රලේඛය සම්බන්ධව/ රේගුවේදී හෝ ආයතනික වශයෙන් මතුවන ගැටළු පිළිබඳ යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍යවේ නම්, දුරකථන අංක: 011-2484930 හා ඊමේල්: admin@ttipd.treasury.gov.lk මගින් නියෝජ්‍ය අධ්‍යක්ෂ, එස්.එච්.ඩී.පී. කලුතන්ත්‍රි මිය අමතා ලබාගත හැකිය.

පී.බී. ජයසුන්දර,
භාණ්ඩාගාර ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :-
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව